# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# සංගීතය
# 8 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනී කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
කේ. ඩී. ප්‍රියන්ත - ගුරු උපදේශක
මල්ෂා ශෂීප්‍රභා - ගුරු සේවය

**සියලු හිමිකම් ඇවිරිණි**

1 පාඩම

1. කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපිත ගී

* හින්දුස්ථානී රාගධාරී සංගීතයේ කෝමළ ග හා කෝමළ නී යොදන රාගයකි. - කාෆි රාගය

* එහි ආරෝහණ - ස රි ගු ම ප ධ නි ස̇

අවරෝහණ - ස̇ නි ධ ප ම ගු රි ස

* මෙහි කෝමළ ග නි යෙදුණ ද ඇතැම්විට ශුද්ධ ග නි ස්වර ද භාවිතා කරයි. ඒ පිළිබඳ වැඩිදුර අධ්‍යයනයේ දී ඔබට දැනුවත් විය හැකි ය.

ගීතය

ස්ථායි

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ස | රි | ගු | - | ම | ප | ප | ප | - | ප |
| සි | රි | සා | s | ර | අ | ති | ශා | න් | ත |
| ම | ප | නි | - | නි | ධ | ධ | ප | - | ප |
| ර | ම | ණී | s | ය | හෙ | ළ | දී | s | ප |
| ම | ප | ධ | ම | ප | ගු | ගු | රි | - | රි |
| ම | ගෙ | මැ | s | ණී | ය | නි | ප්‍රේ | s | ම |
| රි | ගු | ම | රි | ගු | ස | - | - | - | - |
| ඔ | බෙ | පා | s | ව | දි | මි | s | s | s |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ප | නි | - | නි | ස̇ | නි | ස̇ | - | ස̇ |
| සු | වි | නී | s | ත | ග | ති | හා | s | ම |
| නි | නි | ස̇ | - | රි̇ | නි | ධ | ප | - | ප |
| ප | ර | තේ | s | ජ | ක | ළ | හි | s | න |
| ම | ප | ධ | ම | ප | ගු | ගු | රි | - | රි |
| නි | ති | වී | s | ර | ග | ති | පා | s | න |
| රි | ගු | ම | රි | ගු | ස | - | - | - | - |
| ඔ | බෙ | ශ්‍රී | s | වි | දි | මි | s | s | s |

02 දෙතිතට අයත් බෙරපද

★ තිත යනු දේශිය තාල පද්ධතියේ එන්නකි. උඩරට, පහතරට, සබරගමු වශයෙන් නර්තනය ප්‍රභේදවන අතර එහිදී එකම තිත් තාල රූපවලට වෙනස් වූ පද දක්නට ලැබේ. ඒ සම්ප්‍රදායක් හා බැඳි තාල වාද්‍ය භාණ්ඩයේ බෙරපද අනුව ය.

- ★ උඩරට - ගැටබෙරය
- ★ පහතරට - යක් බෙරය
- ★ සබරගමු - දවුල් බෙරය

හින්දුස්ථානී සංගීතයේ (තබ්ලාව) තාල පද පිළිබඳ ඔබ දැනටමත් අධ්‍යයනය කර ඇත. එහිදී සමාන මාත්‍රා ගනනින් බිහි වූ (විභාගයකට පිහිටන මාත්‍රා ගණන සමාන වූ විට) තාල පද සේම මාත්‍රා අසමානව බිහි වූ තාල පද වේ. (දීප්චන්දි/ ඒක් තාල්)

- ★ දේශිය සංගීතයේ තනි තිතට අයත් තාල යනු එසේ සමාන මාත්‍රා සහිත තාල වේ.
- ★ දේශිය සංගීතයේ දෙතිතට අයත් තාල යනු මාත්‍රා අසමාන වූ මිශ්‍ර මාත්‍රා කැටි වූ තාල පද වේ.
- ★ දේශිය තාල පද්ධතියේ තිත් සංඥා වන්නේ තිත්(∧) හා තෙයි(/) අක්ෂරයන් ය. මෙම නාද (ධ්වනි) නිපදවන්නේ තාලම්පට මගින් දෙනු ලබන ආඝාතයන් ගෙනි. (අත්තාල නැගීමෙනි.)

## දෙතිතට අයත් බෙරපද

### සුළුමැදුම් දෙතිත

| | | 1 | 2 | 3 | 4 | 5 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුල් සංඥා | : | ^ | | / | | | ^ | | / | | |
| මාත්‍රා | : | 1 | 2 | 3 | 4 | 5 | 1 | 2 | 3 | 4 | 5 |
| උඩරට බෙර පදය | : | දො | ං | පි | ං | ත | ග | ත | දො | ං | ත |
| පහතරට බෙර පදය | : | ගු | ං | දෙ | ග | ත | ග | ත් | ත | ගු | ං |
| සබරගමු බෙර පදය | : | පි | ං | පි | මි | ත | ත | ත් | ත | කි | ට |
| කවි ගී පාදයක් | : | මො | ර | හි | ඹු | ටු | ද | ම් | ප | නා | - |

### මැදුම් මහ දෙතිත

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුල් සංඥා | : | ^ | | | / | | | | ^ | | | / | | | |
| මාත්‍රා | : | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| උඩරට බෙර පදය | : | දො | ං | දො | පි | ං | ග | ත | පි | ග | ත | දො | ං | ග | ත |
| පහතරට බෙර පදය | : | ගු | ං | ද | ග | දි | ග | ත | ග | ත් | ත | ගු | ඳි | ගු | ඳ |
| සබරගමු බෙර පදය | : | පි | මි | ත් | ත | ක් | කි | ට | ත | ක | ට | පි | ක් | ත | ක |
| කවි ගී පාදයක් | : | උ | දු | ල | ත | රු | වැ | ල | ව | ත | ල | සො | ඳු | රු | - |

### සුළු මහ දෙතිත

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුල් සංඥා | : | ^ | | / | | | | ^ | | / | | | |
| මාත්‍රා | : | 1 | 2 | 3 | 4 | 5 | 6 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| උඩරට බෙර පදය | : | දො | ං | දො | ං | පි | ං | පි | ං | ග | පි | ග | ත |
| පහතරට බෙර පදය | : | දො | ං | දො | ං | ග | ත | ග | ත් | දි | ත් | ත | කු |
| සබරගමු බෙර පදය | : | පි | ං | පි | මි | කි | ට | ත | ත් | ත | රි | කි | ට |
| කවි ගී පාදයක් | : | ව | න් | නි | ල් | ගෙ | ල | නි | ල් | ර | ල් | ව | ර |
| | | ලි | න් | තු | ල් | බි | ගු | දු | ල් | ලා | - | - | - |

## 03 6/8 Rhythm

ව්‍යවහාර සංගීතයේ බහුලව භාවිතාවන තාලයක් ලෙස මෙම තාලය හැඳින් වේ. බටහිර සංගීතයේ 6/8 යන රිද්ම රටාවට (1 2 3  4 5 6) වේගවත් රිද්මයක් ලෙස මෙය හැඳින් වේ. මෙම හින්දුස්ථානී සංගීතයේ දී බෙම්ටෝ තාලය ලෙසත් දේශිය සංගීතයේ දී කඩිනම් මැදුම් තනිතිත ලෙසත් නම් කෙරේ. බයිලා, කපිරිඤ්ඤා ගීතවලදී මෙම තාලය බහුලව භාවිතා වේ. මෙම තාලය මත නිර්මාණය වූ ගීත කිහිපයක් පහත දැක්වේ.

- අම්බිලි මාමේ නුඹ මොකද කරන්නේ
- අහස උසට නැග ගියාට නැහැනෙ අහසෙ රැඳෙන්නේ
- කොටු වැටිච්ච පුංචි සරම ඇඳන් නටන මල්ලියා
- යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැගිලා - පරංගි
- කපන කොටන බිම පෙරලන ඇන ඇන එලවන තැන තැන
- අහසට පිඹිනා එරන් කළේයා.
- දන්න වංහුං අප කන්නසාමි රාජ ධූරයේ
- අයිරින් ජොසපින් කැතරින් ඇන්ජලින්
- අතුරු මිතුරු දඹදිවතුරු රාජ කපුරු සෙට්ටියා

## 04 රවින්ද්‍ර ගී (වංග ගී)

- ★ ඉන්දියාවේ බෙංගාල ප්‍රදේශයේ පවතින ගීත ශෛලියකි.
- ★ මහා කවි රවින්ද්‍රනාත් තාගෝර්තුමා විසින් බෙංගලා තනු රටා ඇසුරෙන් නිර්මාණය කර ලොවපුරා ප්‍රචාරයකරන ලදී. (බාවුල්, කටියාලි වැනි ගායනා ඇසුරෙනි.)
- ★ තනු ඉතා සරල ය. රසවත් ය.
- ★ කෙටි ස්වර පරාසයක් සහිත ය.

★ සීමිත සංගීත භාණ්ඩ සංඛ්‍යාවක් භාවිතා වේ. ස්වර වාද්‍ය භාණ්ඩ ලෙස සර්පිනාව, එස්රාජයත් තාල වාද්‍ය භාණ්ඩ ලෙස කෝල් නැමති බෙරයත් තාලම්පට හා ගෙජ්ජිත් යොදා ගනියි.
★ මීන්ඩ් වැනි ගායන ප්‍රයෝග භාවිතා වේ.
★ මෙම සංගීත ශෛලිය භාවිතා කරමින් මෙරට සරළ ගීත නිර්මාණය කළ සංගීත ශිල්පීන් කිහිප දෙනෙකි. ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත, සූරිය ශංකර් මොල්ලගොඩ ඒ අතර වේ.

මෙරට වංග සංගීතය ඇසුරෙන් නිර්මාණය කළ ගීත කිහිපයක් :-
ඕලු පිපිලා, එන්නද මැණිකේ, හෝ ගා රැල්ල බිඳේ, දිය ගොඩ සැමතැන

**වංග ගීයක්**
**නම්රෙ කිසී බොලෝ රධා**

නම්රෙ කිසී බොලෝරධා ජබොයි දෙකේ තී
අමිත ෂොදොර් බෆොර් දියෝ බොලෝ දෙකෝ තී

බෝලෝ රාධා බොලො රාධා
ජයති තිෂෝර් අමිත ෂොදෝර් ගයති මධූර් ගී
ගයති මධූර් ගී
එක්ව අධර් අයිද බොලෝ අයිද ඔම්රියාද් - තෙරී
ජයති තිෂොර් ජයති තිෂොර් අයිද ඔම්රියාද් //
නම්ර ෙ ර කිසි ...........

## 5 කිතුණු බැති ගී

කතෝලික ආගම හා බැඳි කිතුණු දේවස්ථාවල භාවිතාවන  ගීත වේ.
කැරොල්, පහන්, කන්තාරු ගී වශයෙන් වසරේ විවිධ ආගමික කරුණු මත මෙම ගී ගයයි.
ඉරු දින පල්ලියේ දේව පූජාවල මෙම ගීත ගැයීම සිරිතයි. පල්ලියේ ගායක කණ්ඩායම ප්‍රමුඛව මෙම ගීත ගැයේ.
මිහිරි ගී තනු, හාර්මනි වැයනි ප්‍රයෝග සමග මෙම ගායනා සිදු වේ.
ජාකෝබ් ගොන්සාල්වේස් පියතුමා බොහෝ බැති ගීත ගණනක් නිර්මාණයකර ඇත.

<u>රොනට වඩින</u>

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | ග | ම | ම | රි | ග | ග | ස | රි | - | - |
| ප | ප | ග | ම | ම | රි | ග | - | - | - | - | - |
| ප | ප | ග | ම | ම | රි | ග | ම | ප | ධ | - | - |
| රි | ග | ම | නි | ස | රි | ස | - | - | - | - | - |
| ප | - | - | ධ | - | - | ප | ප | ග | ප | - | - |
| රි | - | - | ප | - | - | ප | ම | රි | ස | - | - |
| ග | - | - | ම | - | - | ග | ග | ස | රි | - | - |
| රි | - | - | ප | - | - | ප | ම | රි | ස | - | - |

රොනට වඩින බිඟු ඔබයි
කැකුළු මල මමයි
මලට සුවඳ ටික ඔබයි
සිගිති පෙති මමයි.

පහන් දොරට හිරු ඔබයි
කුමුදුනිය මමයි
රැයට දිලෙන සඳ ඔබයි
සඳට රැය මමයි.

## 06 මව්ගුණ වරුණ ගී

සරළ ගී සම්ප්‍රදායේ මව්පිය සෙනෙහස වෙනුවෙන් නිර්මාණය වූ ගීත බොහොමයකි. එම හැඟුම් ගීතයක පද මාලාවෙන් ප්‍රකාශවන අතර එය තීව්‍ර කරමින් අසන්නාගේ සිත කම්පනය කිරීමට එහි පදමාලාව හා ගායනය සමත් වේ. එවැනි ගීත කිහිපයකි. පහත දැක්වෙන්නේ,

සොම්නස හෝ ...

සොම්නස හෝ සන්තාපය හමුවේ
සිහිවේ සිහිවේ අම්මා
කරුණා ගුණයේ සාරය සොයලා
නිම කළ පිළිරුව අම්මා

ආදරයේ.... බල මහිමේ රතු ලේ සුදු වූවා
මැණියගේ සෙනෙහසිනේ රට ජාතිය හැදුවා
නිලිමිණි රන් කැට මේවා ඕනැද ඕනෑ නෑ ළඟ අම්මා
නොපෙනෙන දෙවියන් වැන්දේ ඇයි ඔබ
නිවසේ දෙවියන් අම්මා

පාවෙන සුළඟේ සිසිලස හමුවේ
පෙන්වයි සාමය අම්මා
මැණියගේ සෙනෙහසිනේ රට ජාතිය හැදුවා
නිල්මිණි රන් කැට මේවා ඕනැද - ඕනෑ නෑ ළඟ අම්මා
නොපෙනෙන දෙවියන් වැන්දේ ඇයි ඔබ
නිවසේ දෙවියන් අම්මා

ගායනය	සුසිල් ප්‍රේමරත්න
තනුව	සුසිල් ප්‍රේමරත්න
පද රචනය	....


## 07 නූර්ති ගී

සිරිසඟබෝ නූර්තිය
නීතීඥ ජෝන් ද සිල්වා
රාගය - පීළු

සිරි සංඝබෝධි මාලිගාවේ දී මා
දූක ප්‍රාණේ හානි වෙන්ට බැටදෙන්
අල්ලා බන්දා රන්දා බින්දා
උන්දා කොන්දා ලාමී සින්දා
සැන්දෑ කාලෙ මාලිගාවේ ඉන්නවා සොයා

ධර්මේ ශිලේ රක්නා රාජා ලාමී දිවි නසා
කර්මේ වෙන්නෙ කාලෙ බෝ සොඳා
කෝලහාල සිද්ධ වෙන්න කාලෙ බෝ සොඳා
තේජසාර ශිලවන්ත ධර්ම සංඝබෝධි රාජ
භංගකර ලාමි නැර මාලිගා සොයා

## 08 මද්දලය



- දකුණු ඉන්දියානු (කර්ණාටක) සංගීත සම්ප්‍රදායේ එන බෙරයකි.
- දෙමළ බෙරය, ශුද්ධ මද්දලය, මත්තාලම, මද්දලංගය නමින් ද මෙම බෙරය හඳුන්වයි.
- දැතින් ම වයනා තාල වාද්‍ය භාණ්ඩයකි.
- නාඩගම් සම්ප්‍රදාය තුළ මද්දල දෙකක් භාවිතා කරයි. ඒ අඩුතාල් හා වැඩිතාල් ලෙස ය.
- මෙම බෙර කඳට කොහොඹ, ඇසල, කොස් වැනි දැව භාවිතා වේ.
- මද්දල පද කිහිපයකි.
  පසන්, කිර්ලාතා, තංගපාට, කීර්කනම්, වඩිමුඩි

### පසන් තාලය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අඩු තාල් | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| | තා | - | - | ග | ත | ං | දො | ං |
| වැඩි තාල් | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| | දි | කු | ං | තා | - | කු | දො | ං |

### තංගපාට

| | | | | |
|---|---|---|---|---|
| අඩු තාල් | 1 | 2 | 3 | 4 |
| | ජෙංකි | තංකි | තංකි | තංකි |
| වැඩි තාල් | 1 | 2 | 3 | 4 |
| | දින්ත | ංතං | ගතිත | ගතං |

## 09 නව නාට්‍ය ගී

1956 වසරේ එදිරිවීර සරත්චන්ද්‍ර මහතාගේ මනමේ නාටකයත් සමග ශ්‍රී ලංකාවේ නව නාට්‍ය සම්ප්‍රදාය බිහිවිය. නව නාට්‍ය සම්ප්‍රදායේදී සංගීතයට ප්‍රධාන තැනක් හිමි වේ. නාට්‍යෝචිත අවස්ථා සඳහා සංගීතය භාවිතා වූ අතර එහිදී නළු නිළියෝ ම ගායනයේ යෙදුන හ. මේ එවැනි ගීත කිහිපයකි.

අතිරේක උදව්    රතු හැට්ටකාරි නාට්‍යය - නිෂ්පාදනය - ලූෂන් බුලත්සිංහල

දීකිරි දීකිරි ගෙනාවා දීකිරි - මිහිපිට කාටත් ගුණ දෙන දීකිරි
පැටියා මෝරපු දෙනගෙන් ගත් කිරි - හොඳ හැටි උණුකර හින්දා ගත් කිරි
නැවුම් මුට්ටියේ වත්කළ මේ කිරි - පණමට ලාභයි මං දෙන මේ කිරි
කිරි විකුණාලා කාසි සොයන්නයි - අනාගතේ මාලිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි - මගෙ මංගල්ලෙට ඔහෙලත් එන්නයි
හිස මගෙ දෙදරයි දෙපා රුදා දෙයි - රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පණමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි - මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි.

**කුවේණි නාට්‍යය**

සත් සියක් කපුමල් රැගෙන මම - සත් සියක් සුදු කෙඳි රැගෙන මම
සත් සියක් කපු පිළි වියන මම - සත් සියක් දෙන පලඳිතේ
සත් සියක් රත් මල් රැගෙන මම - සත් සියක් රත් හුට රැගෙන මම
සත් සියක් මල් දම් ගොතන මම - සත් සියක් ගෙල පලඳිතේ
සත් සියක් මායා බෙලෙන් මම - සත් සියක් බන්ධන බෙලෙන් මම
සත් සියක් සක්වළ සොයා මම - ගෙන්වූ කුමරුන් අද එතේ ...

## 10 රිද්ම රටාවකට ස්වර යෙදීම

★ රිද්ම රටා හඳුනා ගැනීමට පසුගිය වසරවලදී සමත් වුණි. ඒ අනුව පහත රටාවන් සුදුසු නාද මාලාවකට ඔබින ලෙස ස්වර යොදා පුහුණු වන්න.

උදාහරණ

01.

| | | | |
|---|---|---|---|
| ස - ස | ස ස - | ස - - | ස ස - |
| ස - ස | ස ස - | ස - - | - - - |
| රි - රි | රි රි - | ස - - | ස ස - |
| රි - රි | රි රි - | ස - - | - - - |

02.

| | | | |
|---|---|---|---|
| ස රි ස | ස රි ස | රි - - | - - - |
| රි ග රි | රි ග රි | ග - - | - - - |
| ග ම ග | ග ම ග | ම - - | - - - |
| ප ම ග | ම ග රි | ස - - | - - - |

03.

| | | | |
|---|---|---|---|
| × - | × × | × × | × - |
| × × | × × | × - | - - |
| × - | - × | × × | × - |
| × × | × - | × × | × - |

04.

| | | | |
|---|---|---|---|
| × × × | × - - | × × × | × - - |
| × × × | × × - | × × - | × - - |
| × - - | × - × | × × × | × - - |
| × - × | × - × | × - - | - - - |

05.

| | | | |
|---|---|---|---|
| × × × - | × × × - | × × × × | × - - - |
| × × × - | × × × - | × - - - | - - - - |
| × - × × | × × × - | × × × × | × - - - |
| × - × - | × - × × | × × × × | × - - - |

## 11 පද කොටස්වලට තනු යෙදීම

පහත පද කොටස් සඳහා ඊට සරිලන නාද මාලාවන් යොදා පුහුණු වන්න.

01.

| | | | |
|---|---|---|---|
| ර ළ | පෙ ළ | සු සු | දූ s |
| න ට | න ට | ද ත | ලූ s |
| වෙ ර | ළ ට | පෙ ර | ඵැ s |
| සු දු | පෙ න | බු බු | ඵැ s |

02.

| | | | |
|---|---|---|---|
| ස ඳ එ | ළි යේ එ | කො ඳ පි | බි දේ s |
| නී s ල | ජ ලේ ල | රැ ස් පැ | ති රේ s |
| කො ඳ පි | ස හ පි | නා s සු | ළ ගේ s |
| සු ව ඩි | න් ද ඩි | අ ත නැ | හැ වේ s |

03.

| | | | |
|---|---|---|---|
| අම්මේ s | ඔබගේ s | බිවුකිරි | කඳුළේ s |
| මුදුරස | සුවදේ s | වෙළෙනෙමි | නිබදේ s |
| දෙසවන් | පිනවූ s | නැළවිලි | ගී s යේ s |
| සුමුදුස | රින්මා s | ගතසිත | නැහැවේ s |